www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදයේ තවත් ප්‍රධාන බැංකුවක් බිඳ වැටෙයි

## Another major US bank collapses

පැට්‍රික් ඕ කොනර් විසිනි

2009 අගෝස්තු 17

ඇලබාමාහි කොලෝනියල් බැංකුව බිඳවැටීමත් සමඟ, වසර තුල මේ දක්වා ඇද වැටී ඇති එක්සත් ජනපද බැංකු සංඛ්‍යාව 77 දක්වා ඉහල ගියේය. ඩොලර් බිලියන 25 ක වත්කම් සහිත කොලෝනියල්, ඇමරිකානු ඉතිහාසයේ කඩා වැටුනු හයවන විශාලතම බැංකුව බවට පත් වෙයි. එය, ෆෙඩරල් නියාමකයන් විසින් වොෂින්ටන් මියුචුවල් හි බැංකු කටයුතු අත්හිටුවා, 2008 සැප්තැම්බරයේදී ජේපී මෝගන් චේස් බැංකුවට විකුනා දැමීමෙන් පසුව, වැටුනු විශාලතම බැංකුව ද වෙයි.

*වෝල් ස්ට්‍රීට් ජර්නල්* ප්‍රකාශ කල පරිදි කොලෝනියල්හි බිඳ වැටීම, "ජාතියේ බැංකු අර්බුදයෙහි අනිටු පෙර නිමිත්තක සංඥාවකි. සමහර විශාල ආයතන පවා ස්ථාවර වෙමින් තිබිය දී ප්‍රදේශීය නය දෙන්නන් කඹ මත බමමින් සිටියි. ඒවායින් සමහරක් වත් මුදා ගත හැකිවේ යයි නියාමකයන් තැබූ බලාපොරොත්තු සුන්වී යන බවක් පෙනෙන්නට තිබේ."

කොලෝනියල් බැංකුවේ අභාවය, ආන්තික සාපරාධිත්වය සමඟ අත්වැල් බැඳගත් නොසැලකිලිමත් බවේ සමපේක්ෂනය පිලිබඳ තවත් නිදසුනකි. එය, ෆ්ලොරිඩා හි දේපල වෙලඳපොල වෙත යොමු වූ, ඉවක් බවක් නැතිව නය දීමේ යෙදී සිටි ආයතනයකි. විශේෂයෙන් ෆ්ලොරිඩාවට බලපෑ අවමුඛ උකස් වෙලඳපොලෙහි බිඳ වැටීම, යලි අත්කර ගත නොහැකි පාඩු හා වත්කම් කපාහැරීමේ තත්ත්වයකට කොලෝනියල් බැංකුව ඇද දැමීය. අවසාන කාර්තුවේදී බැංකුව ඩොලර් මිලියන 600 කට වැඩි අලාභයකට මුහුන පැවේය. පසුගිය මාසයේදී එය සතුව තිබූ බිලියන 26 ක මුලු වත්කම් වලින් බිලියන එකක් "බොල් වත්කම් විය."

බැංකුව, ආපදාවට පත් වත්කම් මුදාගැනීමේ වැඩ සටහන (ටාප්) යටතේ ඇප දීමේ මුදලින්, මිලියන 500 කට වැඩි ප්‍රමානයක් ලබාගැනීමට උත්සාහ කල ද, අතිරේකව තවත් මිලියන 300 ක් පුද්ගලික ආයෝජකයන්ගෙන් හෝ අනෙකුත් බැංකු වලින් සොයාගත යුතුය යන කොන්දේසිය බැංකු මත පැනවී තිබුනි. එහෙත් මෙම මුදල් සපයා ගැනීමට දරන ලද උත්සාහය, ෆ්ලොරිඩාහි ටේලර් බීන් සහ විටේකර් යන උකස් සමාගම සමග යෝජිත ගිවිසුම පිලිබඳව ෆෙඩරල් අපරාධ පරීක්ෂනයක් දියත් කර තිබූ තත්ත්වය හමුවේ, අසාර්ථක විය. එෆ්බීඅයි හා භාන්ඩාගාර දෙපර්තමේන්තුවේ ඒජන්තයන් මේ මස මුලදී කොලෝනියල් බැකුවේ කර්යාල වැටලීය.

අගෝස්තු 8 වන දින *වෝල් ස්ට්‍රීට් ජර්නල්* වාර්තා කලේ "බැංකුව තම සන්තකයේ තබාගැනීමට බලාපොරොත්තු නොවූ උකස්කරයන් බිහිකල, සිය නය දෙන අංශය හා එයට සම්බන්ධ වසර ගනනාවක ගිනුම් විකෘති කිරීම්, අධිකරන දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂාවට භාජනය කරමින් සිටින" බවය.

බැංකු වලට අනිටු විපාක නොලබා ක්‍රියාත්මක වීමේ හැකියාව ඉස්මතු කරන කලින් සිද්ධියක දී කොලෝනියල්, සිය මූල්‍ය ගනුදෙනු පිලිබඳ ප්‍රශ්න පලමු වරට නගන ලද අවස්ථාවේ දී එම නියාමකයන් වෙනස් කලේය. 2008 වසරේදී බැංකුව සිය ප්‍රධාන නියාමකයා වූ මූල්‍ය පාලනාධිකාරී කාර්යාලය (ඕඕසී) සමඟ එහි ගිවිසුම අවලංගු කර ඒ වෙනුවට ඇලබාමා රාජ්‍ය නියාමනය තෝරා ගත්තේය. ඒ, ෆ්ලොරිඩා හි වානිජ්‍ය දේපල වෙලඳපොලට බැංකුව නිරාවරනය වී ඇති තරම ඕඕසී විසින් පෙන්වා දීමෙන් පසුවය.

ෆෙඩරල් තැන්පතු රක්ෂන සංස්ථාව (එෆ්ඩීඅයිසී), උතුරු කැරොලිනාහි බීබීඇන්ඩ්ටී යන ප්‍රාදේශීය බැංකුවට, කොලෝනියල් බැංකුවේ හදිසි වත්කම් විකිනීම අධීක්ෂනය කලේය. එය දැන් තැන්පතු අනුව, එක්සත් ජනපදයේ විශාලතම අටවන බැංකුව බවට පත්ව තිබේ. කොලෝනියල්හි බිලියන 15 ක වත්කම් මත ඇතිවිය හැකි අලාභය බීබීඇන්ඩ්ටී සමඟ බෙදාගැනීමට එෆ්ඩීඅයිසී එකඟවීමත් සමඟ ඉහත කී ගනුදෙනුවට දැන් "ලාභ නොලැබීමේ" සහතිකය ලැබුනි. එහෙත් බැංකුවේ බිඳ වැටීම, එෆ්ඩීඅයිසී රක්ෂන සමාගමට බිලියන 2.8 ක පමන පාඩුවක් ගෙන දෙනු ඇතැයි අපේක්ෂා කරන අතර පසුගිය මාර්තුවේදී බිලියන 13 ක් පමනක්වූ එහි තැන්පතු රක්ෂන අරමුදල තව දුරටත් පිරිහෙනු ඇත.

කොලෝනියල් බැංකුවට අමතරව පසුගිය සතියේ බිඳවැටුනු කුඩා බැංකු හතරක්, එනම් නෙවාඩාහි කොමියුනිටි බැංකුව, ඩිවෙලින් හවුස්, යූනියන් බැංකුව හා ඇරිසෝනාහි කොමියුනිටි බැංකුව, එෆ්ඩීඅයිසී සමාගමට තවත් මිලියන 875 ක වැයක් ගෙන ආවේය.

1992 න් පසුව අන් කවර වසරකටත් වඩා වැඩි ආයතන සංඛ්‍යාවක් 2009 වසරේ මේ වන විටත් බිඳවැටී තිබේ. වසර තුල මේ දක්වා බිඳ වැටුනු බැංකු 77 න් 32 ක්ම වැටුනේ පසුගිය සති හත තුලය. ඒ අනුව අසාර්ථකත්වයේ අනුපාතය ඉහල නගින බවක් සලකුනු කෙරෙයි. 15 වන දින *වෝල් ස්ට්‍රීට් ජර්නල්* සටහන් කලේ, එෆ්ඩීඅයිසී සමාගමට සැලකිය යුතු තරමින් වැඩි අලාභයක් සිදුකල බැංකු කර්මාන්තයේ අවසන් අර්බුදය හටගත් 1989-1995 අතර කාලයේ බිඳ වැටුනු බැංකු වලට වඩා දැන් පසුබසිමින් ඇති බැංකුවල තත්ත්වය නරක බවය.

ෆෙඩරල් ඒජන්සිය හඳුනා නොගත් ආයතන 305 ක් "ගැටලු සහගත" බැංකු ලෙස ලේඛන ගතකොට තිබේ. පසුගිය 14 වන දින ප්‍රසිද්ධියට පත්කල *බ්ලූම්බර්ග්* විශ්ලේෂනයකට අනුව කොටස් වෙලඳපොලවල ගනුදෙනු කරන එක්සත් ජනපදයේ නයදෙන්නන් 150 කට වැඩි සංඛ්‍යාවක් ඔවුන්ගේ ගිනුම්වල පවත්වාගෙන යන වත්කම්වල වටිනාකමින් සියයට පහක් හෝ ඊට වැඩි ප්‍රමානයක් "බොල් නය" වන අතර එය, බැංකුවේ සමස්ත ව්‍යාපාර වස්තු වටිනාකමට ම තර්ජනයක් වන මට්ටමකි. "ඇද වැටෙන්නට තරම් විශාල වැඩි" යයි භාන්ඩාගාරය සලකන විශාලතම බැංකු 19 ඇතුලත් නොවන මෙම ආයතන සතු මුලු තැන්පතු ප්‍රමානය, "පලමු කාර්තුව අවසානයේ එෆ්ඩීඅයිසී හි රක්ෂන අරමුදල් තැන්පතුව මෙන් 15 ගුනයක් තරම් වන බිලියන 193 කි."

ජනාධිපති බරක් ඔබාමා පාලනාධිකාරය, බැංකුවල පරිහරනය සඳහා ඩොලර් ට්‍රිලියන ගනනින් මහජන අරමුදල් යොදවමින් මූල්‍ය වෙලඳපොලවල මහා පරිමාන බිඳවැටීමක් වලක්වා ගෙන ඇතත්, පතුලේ ඇති ගැටලු කිසිවකට විසඳුම් සපයා නැත. ට්‍රිලියන දෙක දක්වාවූ බොල් නය හා නොවටිනා සුරැකුම් ("විස සහිත හෝ ගැටලු සහගත" වත්කම් ලෙස හඳුන්වන) බැංකු ගිනුම් අතර තිබේ.

ටාප් පිලිබඳව කොන්ග්‍රසයට වාර්තා කරන ආයතනයක් වන කොන්ග්‍රස් අධීක්ෂන මඬුල්ල පසුගිය සතියේ දී අගෝස්තු සඳහා වන සිය මාසික වාර්තාව නිකුත් කලේය. එහි අවධාරනය කලේ "ගැටලු සහගත වත්කම් ලිහිල්වී ඇත කියා හෝ ඒවා ඇමරිකානු මූල්‍ය පද්ධතියට අතිශය බරපතල අවදානමක් ලෙස තවදුරටත් නොපවතිනු ඇත කියා හෝ සැලකීම මෝඩකමක් වනු ඇත." යනුවෙනි.

"පසුගිය ඔක්තෝබරයේ තිබුන ගැටලු සහගත වත්කම් වලින් විශාල කොටසක් බැංකු ශේෂපත්‍රවල අද දක්වා මත් පවතින බව නිසැක" යයි වාර්තාවේ තව දුරටත් සඳහන් වේ. මෙම වත්කම් බොහෝ දුරට සෑදුම් ලද්දේ, උකස්කර වෙලඳපොල මත්තෙහි ගොඩනැගුනු සුරැකුම් අට්ටාල හා අනෙකුත් සමපේක්ෂන යාන්ත්‍රනයන් හා පැහැර හැරීමට ලක්වූ උකස් නය වලිනි.

"විශේෂයෙන්ම විරැකියාව ඉහල මට්ටමක පැවතීමෙන් හෝ වානිජ්‍ය දේපල වෙලඳපොල බිඳ වැටීමෙන් හෝ ආර්ථිකය නරක අතට හැරෙන්නේ නම් එවිට, නය පැහැර හැරීම් ඉහල නැග ගැටලු සහගත වත්කම් අගය තව දුරටත් පහත වැටෙනු ඇත. බැංකු තමන්ගේ ගැටලු සහගත වත්කම් වලින් තව තවත් පාඩු විඳිනු ඇතැයි" කොන්ග්‍රස් අධීක්ෂන මඬුල්ල අනතුරු අඟවා ඇත.

කිසිවෙකුත් තවමත් අර්බුදයේ සැබෑ පරිමානය ගැන සැලකිලිමත් වී නැත. අධීක්ෂන මඬුල්ලේ වාර්තාව තුල අසාමාන්‍ය ලෙස පිලිගැනීමට ලක්ව ඇත්තේ, "බැංකු වල අවිනිශ්චිත වටිනාකමකින් යුත් නය නිසා ඒවා අකර්මන්‍ය වේ ද නැද්ද යන්න පිලිබඳ තර්කය විසඳිය නොහැකිය." යනුවෙනි.

වෙනත් වචනවලින් කිව හොත් ලෝකයේ ප්‍රමුඛ ආර්ථිකයේ ප්‍රතිපත්ති සැලසුම්කරුවන් කටයුතු කරමින් සිටින්නේ, ජාතික බැංකු පද්ධතිය අකර්මන්‍ය ද යන්න පවා නොදැන ය.

මෙම වසරේ අප්‍රේල් මාසයේදී මූල්‍ය ගිනුම්කාරක ප්‍රමිති මන්ඩලය විසින් හඳුන්වා දුන් ගිනුම් රෙගුලාසි හේතුකොට ගෙන අර්ධ වශයෙන් මෙම නොදැනුවත් භාවය හටගෙන තිබේ.

පැරනි බැංකු රෙගුලාසි අනුව බැංකු සිය වත්කම් තොගවල වෙලඳපොල වටිනාකම් පිලිබඳ වාර්තා තැබීම එදිනෙදා කල යුතුව තිබුනු නමුත් දැන්, සුරැකුම් හා අනෙකුත් විස සහිත වත්කම් වල වෙලඳපොල මිල ගනන් "අඩමාන වෙලඳපොලවල්" මත රැඳවීමට සිදුවන්නේ නම් හෝ වත්කම් වහාම විකුනා දැමීමට අදහස් නොකරන්නේ නම් බැංකු වලට, මෙම වාර්තා තැබීමේ අවශ්‍යතාවය නොතකා හැරිය හැකිය. මෙවන් අවස්ථාවල දී වෙලඳපොලෙහි සැබෑ වටිනාකම සැඟවෙන පරිදි වත්කම්, ඒවා මිලට ගන්නා අවස්ථාවේ පැවති මිලට ලැයිස්තු ගතකල හැකිය.

"බැංකුව අලෙවි කරන්නේ සුරැකුමක හෝ නයක නීතිමය අගය නම්, එවිට බැංකුව විකිනුම් අගය ගිනුම්ගත කල යුතු අතර, එම වත්කම බැංකුව සතු එකක් නම් වත්කමෙහි සටහන් තැබිය යුත්තේ නව රෙගුලාසිවලින් අවසර ලැබෙන ඉහල වටිනාකමට

අනුකූලව ය. එබැවින් පිරිවැයට හිලව් වන අගයකට වඩා අඩුවෙන් කරන ඕනෑම අලෙවියක් කරදරකාරී මිලකිරීම් මගහැරීමේ හැකියාව මත ලැබෙන වාසිය අහිමිකර, සමහරවිට සැලකිය යුතු නය කපාහැරීමකට ද බලකරනු ලබයි. බැංකු ගැටලු සහගත වත්කම් කපා නොහරින තාක් දුරට, දිගටම ඒවායේ ආයෝජනය කිරීමටත් අනාගත ප්‍රතිලාභ අපේක්ෂවෙන් ඒවා තමන් වෙතම රඳවා ගැනීම මගින් වත්කම් අගය, අධිප්‍රමානය වීම වෙනුවට අවප්‍රමානය වෙයි." අධීක්ෂන මඩුල්ල එසේ පැහැදිලි කරයි.

සිය ගැටලු සහගත වත්කම් අනාගතයේ දී වැඩි අගයක් ගනු ඇතැයි යන බැංකුවල තක්සේරුව පදනම්ව ඇත්තේ, වෙලඳපොල ගනන් බැලීම් මත වනවාට වඩා දේශපාලනික ගනන් බැලීම් මතය. අවමුඛ උකස්කර ක්ෂේත්‍රයට අදාල විස සහිත වත්කම්, සපුරාම නොවටිනා බවට පත්ව ඇති අතර, සාමාන්‍ය වෙලඳපොල තත්ත්වයන් යටතේ කවර කලෙකවත් ඒවායේ මුලින් තිබූ වටිනාකම යලි අත්කර ගත නොහැකිය. විරැකියා අර්බුදය නරක අතට හැරෙද්දී හා දේපල වටිනාකම් එක දිගට පහත වැටෙද්දී, උකස් පැහැරහැරීම් අවමුඛ ගනයෙන් බොහෝ ඈතට පැතිර ගොස් ද පැතිර යමින් ද තිබේ. ඩොයිෂෙ බැංකුවේ තක්සේරුවක් උපුටා දක්වමින් ටාප් වාර්තාව සඳහන් කරන්නේ, 2001 වන විට එක්සත් ජනපද නිවාස හිමියන්ගෙන් සියයට 48 කගේ නිවාසවල අගය ඔවුන්ගේ නයට වඩා බෙහෙවින් පහත අගයක් ගනු ඇති බවයි.

ඊට අමතරව වානිජ්‍ය දේපල වෙලඳපොල කඩා වැටෙමින්, වානිජ්‍ය දේපල සුරැකුම් ද පහතට ඇද දැමිය හැකිය. අධීක්ෂන මඩුල්ල පැහැදිලි කලේ මේ මගින් ගැටලු සහගත වත්කම් වල නව ගනයක් නිර්මානය විය හැකි බවත්, "නිවාස උකස් නයෙහි සැබෑ අගය යලිත් ප්‍රශ්නයට බඳුන්වන පරිදි බැංකු ශේෂපත්‍ර මත වඩාත් පොදු පීඩනයක් යොදනු ඇති" බවත් ය.

එසේ වෙතත් බැංකු සිය විස සහිත වත්කම් ශේෂපත්‍රවල රඳවාගෙන සිටින්නේ, අවසානයේ දී ඔබාමා පාලනාධිකාරය මැදිහත්ව මූල්‍ය අර්බුදයට පෙරාතුව තිබුනු ඔවුන්ගේ ලේඛන ගත වටිනාකමට සමාන මිලකට සිය නොවටිනා සුරැකුම් මිලට ගැනීම සඳහා අතිරේක මහජන අරමුදල් යොදවනු ඇතැයි යන බලාපොරොත්තුවෙනි. ආන්ඩුවේ ඍජු මිලට ගැනීම් ශක්‍ය නොවේ යයි පෙනී ගියහොත් ඊට විකල්ප වශයෙන් බැංකු බලාපොරොත්තු වන්නේ ආන්ඩුව, විස සහිත වත්කම් වෙනත් පෞද්ගලික ගැනුම් කරුවන්ට අලෙවි කිරීමට ඉඩ සැලසෙන පරිදි පාඩු නොලැබීමේ අමතර ඇපවීම් හා පොදු සහන පිරිනමනු ඇති බවයි.

ඒ අතරම, පාරිභෝගිකයන්ට හා කුඩා ව්‍යාපාරිකයන්ට බලවත් සේ පහරවැදී ඇති නයදීම් සීමාකිරීමේ භාවිතයන් පවත්වාගැනීමට, විස සහිත වත්කම් මගින් සුව පහසු කඩතුරාවක් බැංකු වලට සපයා දී තිබේ. ටාප් අරමුදල හරහා ඩොලර් බිලියන සිය ගනන් මහජන අරමුදල් සම්පාදනය කිරීමෙන්, වඩා පහසු හා අඩු වියදම් සහිත නය සැපයුමක් සිදුවේ යයි අපේක්ෂා කල ද, මෙය කලමනාකරනය කල නොහැකිව ඇති අතර බැංකු, හුදෙක් තමන්ගේ පහල කඩඉම ශක්තිමත් කර ගැනීම සඳහා මෙම මුදල් යොදාගනිති. බොහෝ අවස්ථාවල දී දක්නට ලැබුනු පරිදි ඔවුන්, අර්බුදය නිර්මානය කිරීමට පලමුවෙන් ම වගකිව යුතු එම විධායකයන්ට ම නිර්ලෝභී ලෙස ප්‍රතිලාභ ගෙවීම සඳහා ද එම මුදල් යොදා ගනියි.

මෑත ම ටාප් වාර්තාවෙන් අවධාරනය කර ඇත්තේ, මිලියන 600 සිට බිලියන 100 දක්වා වූ වත්කම් සහිත මධ්‍යම තරමේ බැංකු, ඇද වැටීමේ අවදානම වැඩියෙන්ම දරා සිටින අතර, බිලියන 21 ක් දක්වා අතිරේක පොදු ප්‍රාග්ධනයක් ඒ සඳහා අවශ්‍ය වනු ඇති බවයි. බැංකු ක්ෂේත්‍රයේ මෙම ස්ථරය නගා සිටුවීම සඳහා වාර්තාව යෝජනා මාලාවක් ඇතුලත් කර තිබේ. මීට, බැංකු වත්කම් හා ප්‍රාග්ධන අරමුදල්වල දිගුකාලීන සුරක්ෂිතභාවය පරීක්ෂාවට බඳුන් කරන පුලුල් රටාවන් ද, එවායේ ගිනුම්වලට ඇතුලත් විස සහිත වත්කම් හෙලිදරව් කිරීමට බල කෙරෙන ප්‍රබල රෙගුලාසි ද ඇතුලත්ය. එහෙත් භාන්ඩාගාර දෙපාර්තමේන්තුව හෝ ෆෙඩරල් මහබැංකුව මේ යෝජිත පියවර කිසිවක් නීති ගත කිරීමට අදහස් නොකරයි.

ඔබාමා පාලනාධිකාරය පෙන්නුම් කර ඇත්තේ තමන් මූල්‍ය ප්‍රභූවේ නිර්දය ආරක්ෂකයෙකු බවය. ප්‍රමුඛ බැංකුවල උපකරනයක් ලෙස ක්‍රියාකරමින් එය, වැඩිවන අනුපාතයකින් සිදුවන බැංකු කඩාවැටීම යොදාගනිමින් සිටින්නේ, එම කර්මාන්තය ප්‍රතිව්‍යුහගත කිරීමටය. කුඩා හා තරගකාරීත්වයෙන් අඩු ආයතන සිතා මතාම වැසී යාමට ඉඩ හරිමින් ඒවායේ අඩමාන නය ෆෙඩරල් නියාමකයන් විසින් අත්පත් කරගන්නා අතර, ඉතිරි වත්කම් හා යටිතල පහසුකම් විශාල මූල්‍යායතන වලට පවරනු ලැබේ. මෙහි ප්‍රතිපලය වනු ඇත්තේ, යෝධ බැංකුවල කුඩා ජාලයක් වෙත ආර්ථික හා සමාජ බලය තව දුරටත් සංකේන්ද්‍රනය වීමයි.

© www.wsws.org